# මෝගල් සිතුවම්වල මානව රූප හා බැඳි වස්ත්‍රාභරණ මගින් ප්‍රකට වන සමාජ තත්ත්වය

කසුන්සරා පුබුදුනී

පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
pkasunsara@yahoo.com

---

භාරතිය ඉතිහාසයෙහි ඉතා වැදගත් වූ පාලන සමයක් ලෙසට මූගල් පාලන සමය අවිවාදයෙන් පිළිගත හැකි ය. මෙම රාජ්‍ය පාලන වකවානුව හේතුවෙන් භාරතයේ දේශපාලනික, සාමාජීය, ආර්ථික, සංස්කෘතික යනාදී අංශවලට විවිධාකාරයෙන් බලපෑම් එල්ල විය. පැරණි භාරතය තුළ ගොඩනැගුණු විශිෂ්ටතම පාලන අවධියක් වන මූගල් පාලන අවධිය මුස්ලිම් පාලනයේ අවසාන මෙන්ම උච්චතම අවස්ථාව ලෙස සැලකිය හැකිය. මෙම පාලන සමයෙහි විශිෂ්ටත්වය කියාපාන එක් අවස්ථාවක් ලෙසට පර්සියන් හා භාරතීය කලා ලක්ෂණ එක්කොට සැදූම් ලත් මූගල් කලාව හඳුනාගත හැකිය. එහිදී සිතුවම් කලාවට හිමිවන්නේ සුවිශේෂි ස්ථානයකි. එලෙස බිහි වූ සිතුවම් අතර විද්‍යමාන වන මානව රූප දැක්වෙන සිතුවම් පිළිබඳව විමර්ශනය කිරීමේදී මානව රූප කලාත්මක අයුරින් සහ සෞන්දර්යාත්මකව ඉදිරිපත් කිරීමේදී අලංකාරත්වය උදෙසා යොදාගෙන තිබෙන වස්ත්‍රාභරණ විශේෂත්වයක් දක්වන බව පෙනේ. ඒ අනුව යම් රටක සංස්කෘතිය ආවේණික වූ සභ්‍යත්වීය ලක්ෂණයන් සමාජ තත්ත්වයන් පෙන්වන කැඩපතක් ලෙසට වස්ත්‍රාභරණ හඳුන්වා දිය හැකිය. කෙසේ නමුත් එම සිතුවම් තුළ වූ මානව රූප සහිත සිතුවම් මගින් එකල සමාජය පිළිබඳව සත්‍ය වූ ද විශ්වාසනීය වූ ද දර්ශනයක් මවාගැනීමට හැකියාව ලැබේ.

මානව රූප හා බැඳි වස්ත්‍රාභරණ පිළිබඳව විමසන කල්හි ප්‍රභූ හා සාමාන්‍ය වශයෙන් සමාජය තුළ දක්නට ලැබෙන ස්තරද්වය මෙහි ද පිළිබිඹු වේ. එම ස්තරද්වයෙහි වස්ත්‍රාභරණ ස්ත්‍රී පුරුෂ වශයෙන් ද යම් යම් වෙනස්කම් අධ්‍යයනය කිරීමට හැකියාව ලැබේ. මෙම සිතුවම්හි පුරුෂ පාර්ෂවය ද ස්ත්‍රීන් මෙන් ම විසිතුරු වස්ත්‍රාභරණයෙන් සිතුවම් කොට ඇති බව දිස්වන අතර එහි දී පුරුෂ පෞරුෂත්වයට කිසිදු හානියක් සිදුනොවන අයුරින් කලාකරුවා විසින් සිතුවම මැනවින් හසුරා සිතුවම් කර තිබෙන බව පැහැදිලි කරගත හැකිය. සිතුවම්කරුගේ දක්ෂතාව මත මනාව ගළපමින් වර්ණ සුදුසු පරිදි යොදාගනිමින් මෙම මූගල් සිතුවම්හි මානව රූප අලංකෘත කර තිබේ. එසේම මෙම මූගල් සිතුවම් පැහැදිලිව අධ්‍යයනය කරන කල්හි මානව රූපයන්හි වස්ත්‍රාභරණ විවිධාකාරයෙන් ඉතාමත් දැකුම්කළු අයුරින් චිත්‍රණය කර ඇති අතර ඇතැම් මානව රූපයන්හි අඳුරු වර්ණයන්ගෙන් ද චාම්බවින් යුක්තව ද ආභරණ අවම වශයෙන් ද යොදාගෙන තිබීමෙන් එකළ සමාජයේ පැවැති සමාජ ස්තර භේදයක් පැවැති බව අධ්‍යයනය කළ හැකිය. කෙසේ නමුත් සමස්තයක් වශයෙන් ගත් කල්හි පෙනීයන්නේ මූගල් සිතුවම් තුළ චිත්‍රණයකර තිබෙන මානව රූපයන්හි වස්ත්‍රාභරණ මගින් එකළ භාරතීය සමාජය තුළ ගොඩනැඟී පැවැති ධනවත්කම බලවත්කම සංස්කෘතිය මෙන් ම ආර්ථිකය ද ප්‍රමුඛ කොටගෙන පැවැති සමස්ත සමාජ තත්ත්ව ප්‍රකට වන බවය.

ප්‍රමුඛ පද : මූගල් සිතුවම්, වස්ත්‍රාභරණ, මානව රූප